



# An incredible love story from China

# චීනයෙන් පුදුම සොඳුරු ආදර කතාවක්

An incredible love story has come out of China recently and managed to touch the world. It is a story of a man and an older woman who ran off to live and love each other in peace for over half a century.


The 70-year-old Chinese man who hand-carved over 6,000 stairs up a mountain for his 80-year-old wife has passed away in the cave which has been the couple's home for the last 50 years.

Over 50 years ago, Liu Guojiang a 19 year-old boy, fell in love with a 29 year-old widowed mother named Xu Chaoqin..

In a twist worthy of Shakespeare's Romeo and Juliet, friends and relatives criticized the relationship because of the age difference and the fact that Xu already had children.

At that time, it was un acceptable and immoral for a young man to love an older woman.. To avoid the market gossip and the scorn of their communities, the couple decided to elope and lived in a cave in Jiangjin County in Southern Chong Qing Munici pality

In the beginning, life was harsh as they had nothing, no electricity or even food. They had to eat grass and roots they found in the mountain, and Liu made a kerosene lamp that they used



6000 steps he carved on the mountain →



The loving couple in their cave home. The modern version of the Romeo & Juliet story ↘

to light up their lives.

Xu felt that she had tied Liu down and repeatedly asked him, 'Are you regretful? Liu always replied, 'As long as we are industrious, life will improve.'

In the second year of living in the mountain, Liu began and continued for over 50 years, to hand-carve the steps so that his wife could get down the mountain easily. Half a century later in 2001, a group of adventurers were exploring the forest and were surprised to find the elderly couple and the over 6,000 hand-carved steps. Liu MingSheng, one of their seven children said, 'My parents loved each other so much, they have lived in seclusion for over 50 years and never been apart a single day. He hand carved more than 6,000 steps over the years for my mother's convenience, although she doesn't go down the mountain that much.'

The couple had lived in peace for over 50 years until last week. Liu, now 72 years, returned from his daily farm work and collapsed. Xu sat and prayed with her husband as he passed away in her arms. So in love with Xu, was Liu, that no one was able to release the grip he had on his wife's hand even after he had passed away.

'You promised me you'll take care of me, you'll always be with me until the day I died, now you left before me, how am I going to live without you?'

Xu spent days softly repeating this sentence and touching her husband's black coffin with tears rolling down her cheeks.

In 2006, their story became one of the top 10 love stories from China , collected by the Chinese Women Week ly. The local government has decided to preserve the love ladder and the place they lived as a museum, so this love story can live forever.

**Deepa Sandamali Herath**
**♦ දීපා සඳමාලි හේරත්**
**USA**

**ෂේ**ක්ස්පියර්ගේ රෝමියෝ ජුලියට් කතා පුවත සිහි ගන්වන චීනයේ සැබෑ ආදර කතාවක් දැන් පිටස්තර ලෝකයේ සිත් සසල කරන්නට හේතු වී ඇත. 70 වියැති චීන මිනිසෙක් තම 80 වියැති බිරිඳගේ පහසුව තකා කන්දක සිය අතින්ම පඩි 6000 ක පඩිපෙලක් තැනීම විශ්මය ජනකය. එහි පසුබිම මෙසේ ය.

ලියු ගුවෝජියැං නම් 19 වියැති තරුණයා, 29 වියැති දරුවන් ද සිටින වැන්දඹුවක හා පෙමින් වෙලුණේය. එකල චීන සමාජයට අනුව එය කිසිසේත් පිළිනොගන්නා අවිනීත දෙයක් නිසා ඒ පෙම් යුවල කඳුකරයට පැන ගියහ.

ඒ පාළු කඳුකරයේ ජීවිතය ඉතා කටුක රළු එකක් විය. විදුලි එළිය හෝ කෑමට දෙයක් තිබු ණේ නැත. බොහෝ විට ඔව්හු තණ පඳුරු උදුරා ඒ මුල් ආහාරයට ගත්තෝය. කාන්තාව නිතරම තම සහකාරයාගෙන් ඇසූ දෙයක් විය.

"ඔබ මා සමග මෙසේ ආවාට පසුතැවෙනව ද? " යන්නයි.

"නෑ එහෙම දෙයක් නෑ. අපට ඉක්මනට හොඳකාලයක් ඒවි "

ඔහු ඇයට පිළිතුරු දුන්නේය.

කඳුකරයට ගිය දෙවෙනි වසරේදී ලියු තම බිරිඳට කන්දෙන් බැස පහළට ඒම පහසු වනු පිණිස කිසිදු උපකරණයක් සොයාගන්නට නොහැකි නිසා තම අතින්ම දැඩි මහන්සියෙන් කන්ද හාරා පඩි පෙළක් තැනීය. එහි පඩි ගණන 6000 කි.

අවුරුදු 50 කට පසු 2001 දී චීන ශිෂ්‍යයින් පිරිසකට එම කඳුකරය පීරා නැගගෙන ගිය විට සෙසු ලෝකයෙන් අඩසිය වසක් වෙන්ව සිටි මේ පෙම්වත් යුවල හමුවීය. මේ කතාන්තරය හෙළිවුණේ එවිට ය.

ගිය සතියේ සැමියා ලියු, බැහැරගොස් ගෙදර ආ සැනින් ඇදගෙන වැටිණ. වයෝවෘද්ධ බිරිඳ ඔහු ඔසවා උකුලේ හොවා ගෙන හිස අත ගාද්දීම ලියු මිය ගියේය. මෙය අද චීනයේ ප්‍රධාන තම ආදර කතාව බවට පෙරළී ඇත. ලියු සහ සූ විසූ එම කඳුකර නිවහන හා පඩිපෙළ අද කෞතුකාගාරයකට හරවා ඇත.

# ශ්‍රීලංකා ක්‍රිකට් තරු බොලිවුඩ් සිනමාවට

**වි**ක්ටරි (victory) නම් ඉන්දියානු බොලිවුඩ් චිත්‍රපටයක් සඳහා ගියමස කොළඹ පැරණි ඕවල් ක්‍රිකට් පිටියේදී දර්ශන කැමරාවට නැගිණ. ශ්‍රීලංකා ක්‍රිකට් පිලේ සුපිරි ක්‍රීඩකයින් වන සනත් ජයසූරිය, මුත්තයියා මුරලිදරන්, කුමාර් සංගක්කාර සහ බොම්බායේ තරුණ ජනප්‍රිය නළුවෙකු වන හර්මන් ජඩේජා එම දර්ශන සඳහා පෙනී සිටියහ.

ඩොලර් මිලියන 10 ක් වැයකර තනාගෙන යන **වික්ටරි** චිත්‍රපටයේ කතා තේමාව වී ඇත්තේ ඉන්දියාවේ ගමක හැදුණු වැඩුණු ක්‍රිකට් පිස්සුවක් ඇති තරුණයෙක් ඉන්දියානු ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩාකරන්නට සිහින මවා අවසානයේ ඒ සිහිනය මුදුන් පමුණුවාගෙන ඉන්දියාව වෙනුවෙන් ජාත්‍යන්තර තරඟාවලියකටද මුහුණ දෙන ආකාරයයි. මෙහි එම ඉන්දිය තරුණයාගේ භූමිකාව රඟපානු ලබන්නේ පාන්නේ ජනප්‍රිය තරුණ බොලිවුඩ් නළුවෙකු වන හර්මන් ජඩේජා විසිනි.



**හර්මන් බවේජා**

මෙම **වික්ටරි** චිත්‍රපටයේ ඉන්දියානු ක්‍රිකට් කණ්ඩායමට අමතරව ඕස්ට්‍රේලියාවේ වේග පන්දු යවන බ්‍රෙට් ලී, එංගලන්ත පිළේ පන්දු යවන්නන් වන සයිමන් ජෝන්ස් සහ සජිඩ් මහමුද් සහ නිව්සීලන්ත කණ්ඩායමේ ක්‍රෙග් මැක්මිලන් ද තෝරාගෙන ඇත. මෙහි මූලික දර්ශන ඉන්දියාවේ දී කැමරාගත කර තිබේ. චිත්‍රපටයේ ශ්‍රීලංකාවේ කොටස් භාරව සිටින්නේ අධ්‍යක්ෂක චන්ද්‍රන් රත්නම්ය.

**වික්ටරි** ක්‍රිකට් වටා ගෙතුණු ප්‍රථම චිත්‍රපටය නොවේ. මීට පෙර තැනූ **ලගාන්** හොඳම විදේශීය චිත්‍රපටය ලෙස නම් කෙරුණි.